# බෞද්ධ උපදේශනයෙහි දාර්ශනික පදනම පිළිබඳ අධ්‍යයනයක්

මුවපැටිගේවෙල හේමාලෝක හිමි[1]

## ගැටලුව

මෙහි අධ්‍යයන ගැටලුව වන්නේ බෞද්ධ උපදේශනයෙහි දාර්ශනික පදනම ගොඩනැගෙන්නේ කෙසේද යන්න යි.

## අරමුණු

මෙහි දී ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරන්නේ අනුශාසනාව හෙවත් බෞද්ධ උපදේශනයෙහි දාර්ශනික පදනම සකස් වී ඇති ආකාරය අනාවරණය කිරීම යි. විශේෂයෙන් ම එකී දාර්ශනික පදනම සකස්කරන මූලික බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කෙරේ. එසේ ම බටහිර උපදේශනයට සාපේක්ෂ ව බෞද්ධ උපදේශනයෙහි ස්වභාවය පිළිබඳ ව ද අවධානය යොමුකෙරේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදුකිරීම සඳහා දත්ත ලබාගන්නේ ග්‍රන්ථ අධ්‍යයනය මගිනි. ඒ අනුව ත්‍රිපිටක මූලාශ්‍රය ග්‍රන්ථ සහ පශ්චාත් බෞද්ධ සාහිත්‍ය කෘති උපයෝගී කරගනු ලැබේ. එසේ ලබාගන්නා ලද තොරතුරු පර්යේෂණ ක්‍රමවිද්‍යාවේ සම්මත ක්‍රමවේදයන්ට අනුව විශ්ලේෂණය කොට ඉදිරිපත් කරනු ලැබේ.

## වැදගත්කම

බුදුදහමේ තවමත් පුළුල් ලෙස අධ්‍යයනයට ලක්නොවූ පැතිකඩ රාශියක් ඇත. බෞද්ධ මනෝ උපදේශනය ද එවැනි විෂය ක්ෂේත්‍රයකි. අධ්‍යයනය කිරීමට පුළුල් විෂය පරාසයක් තිබුණ ද ඒ පිළිබඳ ව සිදුකෙරෙන පර්යේෂණවල සීමිත බව නිසා මෙය තවමත් සංවර්ධනය වෙමින් පවතින විෂය ක්ෂේත්‍රයක් වශයෙන් සැලකීමෙහි වරදක් නැත. ඒ අනුව මෙහි දී අප අධ්‍යයනයට භාජනය කරන උපදේශනයෙහි දාර්ශනික පැතිකඩ පිළිබඳ ව ද උගතුන්ගේ සැලකිය යුතු අවධානයක් යොමුවී නැති බව පෙනී යයි. බොහෝ විට ඔවුන්ගේ අවධානය යොමු වන්නේ බෞද්ධ උපදේශනයෙහි මනෝවිද්‍යාත්මක පැතිකඩ වෙතට ය. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් බෞද්ධ උපදේශනයෙහි දාර්ශනික පදනම කෙසේ සකස් වන්නේ ද යන්න අනාවරණය කරගත හැකි ය.

---

[1] ආරාධිත කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය

සාකච්ඡාව

නූතන බටහිර මනෝවිද්‍යාව බිහිවීමෙහි ලා 19 වන සියවසේ ඇතිවූ විද්‍යාත්මක ප්‍රබෝධය බෙහෙවින් ඉවහල් විය. එහෙත් මනෝවිද්‍යාවේ මූල බීජයන් ඉපැරණි ග්‍රීක දර්ශනය ඇසුරින් පැනනැගුණු බව ප්‍රකට කරුණකි. සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි සුප්‍රකට දාර්ශනිකයන් සතුට, වේදනාව, දැනුම, අභිප්‍රේරණය, තර්කය හා මානසික ව්‍යාධීන් වැනි මනෝවිද්‍යාවේ සාකච්ඡාවට බඳුන් කරන මාතෘකා පිළිබඳ ව උනන්දුවක් දක්වා ඇත. ලෝකයේ සෑම ශිෂ්ටාචාරයක ම පාහේ දාර්ශනික සංකල්පවලට දිගු ඉතිහාසයක් ඇති බව ඒවා අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි. ඒ අනුව දර්ශනය මනෝවිද්‍යාවේ මව් විෂය වශයෙන් සැලකිය හැකි ය.

ක්‍රි. පූ. හය වන සියවසේ පහළ වූ බුදුදහම ද සත්ත්වයා හා ලෝකය පිළිබඳ ව විශ්ලේෂී සහ සංශ්ලේෂී විග්‍රහයන්ගෙන් යුක්ත වූ තාර්කික දර්ශනයකි. බුදුදහම මූලික වශයෙන් දර්ශනයක් ලෙස සලකනු ලැබුවත් එහි ඇති ආචාර විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක විග්‍රහයන් නිසා හුදු දර්ශනයක් ලෙස පමණක් සැලකිය නො හැකි ය. බෞද්ධ ඉගැන්වීම්වල ඇතුළත් ඇතැම් මනෝවිද්‍යාත්මක සංකල්ප එයට ම ආවේණික වූ දාර්ශනික හැඩතලවලින් යුක්ත ය. එසේ ම ඇතැම් සංකල්ප නූතන මනෝවිද්‍යාව හා සැසඳෙන ආකාරයෙන් ඉදිරිපත් වී ඇත. කෙසේ නමුත් නූතනයේ බුදුදහමේ අන්තර්ගත මනෝවිද්‍යාත්මක විග්‍රහයන් පිළිබඳ ව ප්‍රාමාණික මට්ටමෙන් අධ්‍යයනයන් සිදු කෙරුණත් ඒවා බොහෝ විට අවශ්‍ය ප්‍රමාණය ඉක්මවමින් බටහිර සිද්ධාන්ත සමග තුලනය කිරීමට උත්සාහ කිරීම නිසා බෞද්ධ අනන්‍යතාව පැහැදිලි ව ඉස්මතු නො වන බවක් ද පෙනී යයි. බුදුදහමේ සෑම මනෝවිද්‍යාත්මක සංකල්පයකට ම පාහේ එයට ම ආවේණික වූ දාර්ශනික පදනමක් ඇත. විශේෂයෙන් ම බෞද්ධ මනෝ උපදේශන සිද්ධාන්ත ගොඩනැගී ඇත්තේ එකී දාර්ශනික පදනම මුල්කොටගෙන ය. බොහෝ විට බෞද්ධ මනෝවිද්‍යාව පිළිබඳ ව අධ්‍යයනය කරන පර්යේෂකයන් එකී දාර්ශනික අර්ථය ඉස්මතු කොට දැක්වීමට උත්සාහ නො කරන බවක් පෙනේ. එබැවින් මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කරන්නේ බෞද්ධ මනෝවිද්‍යාත්මක උපදේශන සිද්ධාන්තවල දාර්ශනික පදනම පිළිබඳ ව අධ්‍යයනය කිරීම යි.

බෞද්ධ උපදේශනය 'අනුශාසනා' යන විශේෂ නාමයෙන් හඳුන්වනු ලැබේ. අනුශාසනාව හෙවත් උපදේශනය මිනිසා හා ඔහුගේ ගැටලු පිළිබඳ ව සාකල්‍යවාදී (Holistic) ප්‍රවේශයකි. එනම්, ගැටලුව (දුක්ඛ), ගැටලුවට හේතුව (සමුදය, පච්චය), ගැටලුවට විසඳුම් ලබාදීම (නිරොධ) සහ ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය (මග්ග) යන පූර්ණ සහ ක්‍රමවත් උපදේශන ක්‍රියාවලියකින් යුක්ත ය. බෞද්ධ

උපදේශනය සාමාන්‍ය බටහිර උපදේශන ක්‍රියාවලියෙන් ඔබ්බට ගොස් පුද්ගලයාගේ මෙලොව ජීවිතය යහපත් කිරීම (දිට්ඨධම්මික), පරලොව ජීවිතය යහපත් කිරීම (සම්පරායික) මෙන් ම ආත්මසාක්ෂාත්කරණය අරමුණු කොටගෙන ගොඩනැගී ඇත. පුද්ගලයා ලෞකික සුවතාවයේ සිට ක්‍රමානුකූල ව ලෝකෝත්තර සුවතාව දක්වා රැගෙන යෑම බෞද්ධ උපදේශනයෙහි ඒකායන අරමුණ බව සතිපට්ඨාන සූත්‍රයේ මෙසේ විග්‍රහ වේ.

"සොකපරිද්දවානං සමතික්කමාය...."

බෞද්ධ උපදේශනයෙහි අරමුණ පිළිබඳ ව තවදුරටත් ගැඹුරින් අවධානය යොමුකිරීමේ දී පෙනීයන්නේ එමගින් මිනසාගේ පෞද්ගලික ගැටලුවලට විසඳුම් ලබාදෙනවාට වඩා ඔහු විසින් මුහුණ දෙනු ලබන පොදු ගැටලුවලට විසඳුම් ලබාදීම යි. මෙකී විසඳුම් තාවකාලික ඒවා නො වන අතර පුද්ගලයා සර්වකාලීන ව කායික, මානසික සුවතාවකට රැගෙන යයි. පුද්ගලයා හා ලෝකය පිළිබඳ ව යථාර්ථය අවබෝධ කරගැනීම තුළින් සෑම ගැටලුවකට ම විසඳුම් ලබාගත හැකි ය යන්න බෞද්ධ ස්ථාවරය යි. එකී යථාර්ථ සාධනය (යථාභූතඤාණදස්සනං) අවසාන අරමුණ විය යුතු අතර බෞද්ධ උපදේශනයෙහි දාර්ශනික අර්ථය සහ පදනම ඒ තුළින් සකස් වේ.

උපදේශය ලබාගැනීමට පැමිණෙන පුද්ගලයා කිසිවිටෙකත් යහපත් මානසික තත්ත්වයකින් පසුවන්නෙක් නො වේ. ගැටලුකාරී මනෝභාව නිසා ඔහු යථාර්ථයෙන් ඈත්වී ඇත. එහෙත් ඔහු යථාර්ථය සාධනය කිරීමේ විභව්‍යතාවෙන් (Potentiality) යුක්ත වූවෙකි. එම විභව්‍යතාවන් අවදිකිරීම, දියුණු කිරීම, ප්‍රාථමික මට්ටමේ සිට ද්විතියික මට්ටම දක්වා රැගෙන යා යුතු ය. එනම්, පහළ මට්ටමෙන් ආරම්භ කොට ඉහළ මට්ටම දක්වා පුද්ගලයා ක්‍රමානුකූල ව රැගෙනයාම යි. මෙකී බෞද්ධ උපදේශනයෙහි යථාර්ථය ප්‍රතිවේධ කිරීමට උපකාර වන ආදි බෞද්ධ ඉගැන්වීම් රාශියකි. ඒවා බෞද්ධ මනෝ උපදේශනයෙහි පදනම සකස්කරන සිද්ධාන්ත වශයෙන් සැලකිය යුතු ය. ඒවා නම්:

- ඛන්ධ, ආයතන, ධාතු විභාගය
- පටිච්චසමුප්පාදය
- චතුරාර්ය සත්‍යය
- ත්‍රිලක්ෂණය

මෙහි දී අප බලාපොරොත්තු වන්නේ මුල් බුදුසමයේ ඉගැන්වීම් පිළිබඳ ව විස්තර විචාර සිදුකිරීමට නො වේ. බෞද්ධ මනෝ උපදේශන සිද්ධාන්තවල පදනම සකස්කරන මෙකී ඉගැන්වීම් කුමන අරමුණකින් ඉදිරිපත් වී ඇත්ද යන්න විවරණය

කිරීම අපගේ ප්‍රධාන අරමුණ යි. එය බෞද්ධ මනෝ උපදේශන සිද්ධාන්තවල දාර්ශනික අර්ථය තේරුම් ගැනීමට උපකාර වේ.

ඛන්ධ, ආයතන, ධාතු පිළිබඳ ව ගැඹුරු විග්‍රහයක් සංයුක්ත නිකායේ ඛන්ධ වග්ගයේ අන්තර්ගත වන අතර එහි දී සත්ත්වයා හා ලෝකයේ භෞතික හා මානසික අංශද්වය ගැඹුරු විශ්ලේෂණයකට භාජනය කොට ඇත. අනිත්‍යතාව විශ්වසාධාරණ නියමයක් බව මෙමගින් අවධාරණය කෙරේ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන මෙම ත්‍රිලක්ෂණයෙන් විශ්වයේ අසාරත්වය, අතෘප්තිය විවරණය කොට ඇත. අප ලෝකය ලෙස සම්මුතිය මගින් දකින ලෝකය සැබෑ ලෝකය නො ව සංකල්පීය ලෝකයකි. ඒ ඒ පුද්ගලයා එකී සංකල්පීය ලෝකවල ජීවත්වේ. එය මායාවකි. ලෝකය හා සත්ත්වයා පිළිබඳ සැබෑ ස්වභාවය නො වේ. සංකල්ප ලෝකය බිඳවැටෙන විට දුගියෙකු මෙන් තැවේ. (සංකප්පෙහි පරෙතො කපනො විය ඣායති) උලකින් අනිනු ලැබුවෙකු මෙන් වේදනා විඳියි. (තෙ කාමා පරිහායන්ති - සල්ලවිද්ධොව රුප්පති) විශ්වය පිළිබඳ ව තථ්‍ය ස්වභාවය ඉදිරිපත් කොට ඇත්තේ පරමාර්ථ සත්‍යය තුළිනි. එනම්, ලෝකයේ භෞතික සහ මානසික වශයෙන් පවතින සියල්ලක් ම කොටස්වලට බෙදා දැක්වීම මගිනි. නීවරණ ධර්මවලින් පුද්ගල මනස වැසී ඇති නිසා ලෝකයේ සැබෑ ස්වභාවය අත්දැකීම දුෂ්කර ය. එබැවින් පුද්ගලයා විපරීත සංකල්පවලින් නිතර ජීවත්වෙයි. අප ඇලුම් කරන්නේ එම සංකල්පයන්ට මිස සැබෑ ලෝකයට නො වේ. (සංකප්පරාගො පුරිසස්ස කාමා) එනිසා සිඳදැමිය යුත්තේ ලෝකය නො ව ඒ පිළිබඳ අප විසින් ගොඩනගාගෙන ඇති විපරීත සංකල්පයන් ය. සිත සංකල්පවලින් වියුක්ත වූ කල ලෝකය දුක පිණිස හේතු නො වේ. අතෙහි තුවාලයක් නොමැති නම් ඒ මත විස තැබූ විට ශරීර අභ්‍යන්තරයට නො යන නිසා හානියක් නො වේ. (පාණිම්හි චෙ වණො නාස්ස - හරෙය්‍ය පාණිනං විසං) ගැටලු ඇතිවන්නේ ඇලීම් (තණ්හා) හා ගැටීම් (දෝස) නිසා මිස ලෝකයේ වරදක් නිසා නො වේ.

යමක් අනිත්‍ය නම් එය ඒකාන්තයෙන් ම දුක්ඛ ස්වභාවයෙන් යුක්ත ය. (යදනිච්චං තං දුක්ඛං) අස්ථිර දෙයකින් ස්ථිර සතුටක් ලැබිය නොහැකි ය. කාම වස්තූන් මගින් ලබන ඉන්ද්‍රිය සතුට තාවකාලික ය. ලෞකික මිනිසාගේ ස්වභාවය එකී කාමාස්වාදයෙහි ඇලීම යි. ඇලීම වනාහී දුකෙහි උල්පත යි. යමක් දුක්ඛ ස්වභාවයෙන් යුක්ත නම් එය ඒකාන්ත වශයෙන් ම අනාත්ම ස්වභාවයෙන් යුක්ත ය. (යං අනත්තං තං දුක්ඛං) විනාශ වන දෙයකින් සතුටක් ලැබිය නො හැකි නම් එය ආත්ම වශයෙන් ගැනීමෙහි ඵලය කුමක් ද? ඒ අනුව ඛන්ධායතනධාතු විභාගය මගිනුත් ත්‍රිලක්ෂණය මගිනුත් සත්ත්වයා හා ලෝකය පිළිබඳ ව විශ්ලේෂී සංකල්පයක් ඉදිරිපත් කරන්නේ අනිත්‍යතාවත් අසාරත්වය හා අතෘප්තිකර

ස්වභාවයත් හෙළිකරනු පිණිස යි. එහි ආදීනව තුළින් කළකිරීමට පත්වන පුද්ගලයා ප්‍රඥාව අවදි කොටගෙන විශුද්ධියට පැමිණේ. (අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා)

මෙම න්‍යායාත්මක විග්‍රහය අනුව උපදේශනයේ දී අරමුණ විය යුත්තේ පුද්ගලයා මායාකාරී සංකල්පීය ලෝකයෙන් මුදවාගෙන සැබෑ ලෝකයට පැමිණවීම යි. එවිට ඔහු ලෝකය පිළිබඳ ව සංකල්පීය නිර්මිත බිඳදමා කාමවස්තූන් සහ එයින් ලබන ආස්වාදයෙහි අසාරත්වය අවබෝධ කරගනී.

බෞද්ධ ඉගැන්වීම් සැමවිට ම තාර්කික පදනමක් මත පිහිටා ගොඩනැගී ඇත. යමක හෝ යමක් අතර තිබෙන සම්බන්ධය සහේතුක ව පිළිගැනීම තාර්කික බවෙහි ප්‍රධාන ලක්ෂණයකි. (හේතුං පටිච්ච සම්භූතං - හෙතුභංගා නිරුජ්ඣති) සහේතුක ව හටගත් දෙය සහේතුක ව ම නිරුද්ධ වේ. යම් දෙයක පැවැත්ම රඳා පවතින්නේ තවත් දෙයක් නිසා නම් එයින් එකක් නැති කළ විට අනෙක ද අභාවයට යයි. යම් දෙයක පැවැත්මට සාපේක්ෂ වන අනෙක් දෙය කුමක්දැයි අප දන්නේ නම් එය නිෂ්පාදනය කිරීමෙන් එම මූලික දෙය ද අපට නිර්මාණය කොටගත හැකි ය. ඒ අනුව ලොව සැම සංසිද්ධියක ම ස්වභාවය සාපේක්ෂකත්වය නිසා ඒ සියල්ල අපට අවශ්‍ය පරිදි හැසිරවීමට හැකියාව ඇත.

කිසියම් ගැටලුවක් ඇතිවීම කෙරෙහි බලපාන හේතු පිළිබඳ ව විමසීමකින් තොර ව ඒ සඳහා විසඳුම් ලබාදිය නො හැකි ය. බෞද්ධ හා බටහිර උපදේශනද්වය ම ගැටලු කෙරෙහි බලපාන නිශ්චිත හා පැහැදිලි හේතු අනාවරණය කරගැනීම පිණිස උනන්දුවක් දක්වයි. හේතු නිශේධනය කළ කල්හි ඊට අදාළ ඵලය ද ස්වභාවයෙන් ම නිශේධනය වේ. එබැවින් ගැටලුවල මූලය පැහැදිලි ව හඳුනාගත යුතු ය. (විතක්කමූලභෙදහෙතු)

බෞද්ධ උපදේශනය කේන්ද්‍රගත වී ඇත්තේ පුද්ගලයා මුහුණ දෙන පොදු ගැටලුවලට විසඳුම් ලබාදීමට බව ඉහත සඳහන් කෙරිණි. පුද්ගලයා ජාති, ආගම්, කුල භේදයකින් තොර ව මුහුණ දෙන පොදු ගැටලු නම් ජාති ජරා ව්‍යාධි මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන ආදිය යි. මෙකී අපමණ ගැටලු හේතුප්‍රත්‍යයන්ගෙන් හටගන්නා ආකාරය පටිච්චසමුප්පාද න්‍යාය මගින් විග්‍රහ කොට ඇත. ඒ අනුව මෙය සංශ්ලේෂණාත්මක ව ඉදිරිපත් කිරීමකි. දීඝනිකායේ මහානිදාන සූත්‍රයේ ජරාමරණ දුක පටිච්චසමුප්පන්න ව ඇතිවන අයුරු විස්තර කොට තිබේ. ලෝකයේ පවතින සැම සංසිද්ධියක් ම හා ප්‍රපංචයක් ම පටිච්චසමුප්පාද න්‍යාය ඇසුරින් විස්තර කළ හැකි ය. පුද්ගලයාගේ සන්තානගත දුක පමණක් නො ව සමාජගත දුක ඇතිවන ආකාරය ද මහානිදාන සූත්‍රයේ විස්තර වේ. සුත්තනිපාතයේ කලහවිවාද සූත්‍රයේ සමාජගත නොයෙකුත්

කලකෝලාහල පටිච්චසමුප්පාද න්‍යාය ඇසුරින් පැහැදිලි කරයි. ඒ අනුව බෞද්ධ උපදේශනය සෑමවිට ම හේතුඵලවාදී දර්ශනය මත පදනම් වන බව පැහැදිලි ය.

පුද්ගලයා කායික මානසික උපරිම තෘප්තිමත්භාවයකට පත්කිරීම බෞද්ධ උපදේශනයේ ආවසානික පරමාර්ථය වියයුතු ය. ඒ සඳහා අවශ්‍ය කරන මාර්ගය දුක්ඛනිරෝධගාමිනීපටිපදා ආර්ය සත්‍යය මගින් පෙන්වා දෙන අතර එහි මෙලොව ජීවිතය මෙන් ම පරලොව ජීවිතය සාර්ථක කරගැනීමට ද අවශ්‍ය මාර්ගය මැනවින් විස්තර කරයි.

ඒ අනුව බෞද්ධ උපදේශනයෙහි දාර්ශනික පදනම සකස් කිරීමෙහි ලා ඛන්ධායතනධාතු විභාගය, චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදය, ත්‍රිලක්‍ෂණය ආදී දාර්ශනික බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද: බෞද්ධ උපදේශනය, දාර්ශනික පදනම, මනෝවිද්‍යාව, ඛන්ධායතනධාතු විභාගය, පටිච්චසමුප්පාදය

ආශ්‍රිත ග්‍රන්ථ

ගල්මංගොඩ, සුමනපාල. (1994). *ආදි බෞද්ධ දර්ශනය: මූලධර්ම විග්‍රහයක්*, අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ, කඩවත.

ගුණතිලක, එච්. එම්. (2016. නිවන් මග: බෞද්ධ උපදේශන මනෝවිද්‍යාව (47 කලාපය), ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.

රාහුල හිමි, වල්පොළ. (1977). *බුදුන් වදාළ ධර්මය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල.

De Silva, P.(1979). *An Introduction to Buddhist Psychology*. The Macmillan Press Ltd.

Kalupahana, D.J. (1987). *The Principals of Buddhist Psychology*. State University of New-York Press.